# කළමනාකරණ කමිටු රැස්වීම.

දිනය - 2017.04.24

වේලාව - ප.ව. 02.30

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

මූලාසනය - **එම්.ඒ.බී. දයා සෙනරත් මයා (ප්‍රධාන ලේකම් - බ.ප.)**

සහභාගී වූ නිලධාරීන්,

- **කේ.කේ.චම්පිකා කනේරු මිය**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)**
- **සිරිසෝම ලොකුවිතාන මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
- **ඩී.එම්.එන්. දිසානායක මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)**
- **ඩබ්ලිව්.එම්.ඩී.එන්.රණසිංහ මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)**
- **ඩබ්ලිව්.එම්.දයාවතී මිය.**
  **ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)**
- **ජී.ඒ.එන්. ජයන්ත මයා.**
  **ආදායම් කොමසාරිස් (බ.ප)**
- **චම්පිකා පතිරණ මිය.**
  **ප්‍රධාන අභ්‍යන්තර විගණක**
- **සුනේත්‍රා පතිරත්න මිය.**
  **අධ්‍යක්‍ෂ (අයවැය)**
- **ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය.**
  **අධ්‍යක්‍ෂ (ඉංජිනේරු)**
- **මහේෂ් විජේසේකර මයා.**
  **අධ්‍යක්ෂ (ගොඩනැගිලි)**
- **ටිෂානි රාමනායක මිය.**
  **අධ්‍යක්‍ෂ (සැලසුම්)**
- **එල්.ඒ.බී.එල්,ගුණසේන මිය.**
  **ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)**
- **පී. කණිෂ්ක ශ්‍රී ලාල් මයා.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**

# සාකච්ඡා කරන ලද කරුණු

## පාලන අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | සැලසුම් අංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන නිලධාරීන් සඳහා උපකරණ මිලට ගැනීම සම්බන්ධව යොමු කර ඇති ලිපි. (2/5/2/පළා/පොදු-2017 - 2017.03.13 ලිපිය සහ DSTH/FN/11/2017 - 2017.03.13 ලිපිය) | පළාත් සභාවට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරනු ලබන නිලධාරීන් සඳහා කාර්යාලීය උපකරණ මිලදී ගැනීමේ දී, අවශ්‍ය අවම උපකරණ ලැයිස්තුව ප්‍රධාන ලේකම් මඟින් අනුමත කර ගැනීමෙන් අනතුරුව, අදාළ ආයතනය විසින් මිල ගණන් කැඳවීම සිදු කර, අවශ්‍ය මුදල ප්‍රධාන ලේකම් වෙත දැන්විය යුතු ය.<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40 සඳහා පළාත් සභා අංශය ස්ථාපිත කිරීම.<br>පළාත් සභාවේ සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර, දිස්ත්‍රික්ක 3හි ප්‍රාදේශීය ලේකම්වරු, ගණකාධිකාරීවරු සමඟ පළාත් සභා නිලධාරීන් සමඟ රැස්වීමක් සංවිධානය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

## පිරිස් හා පුහුණු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය වෙනුවෙන් නව “සහකාර අධ්‍යක්ෂ” තනතුර | නව “සහකාර අධ්‍යක්ෂ” තනතුර වෙනුවෙන් සුදුසු පුද්ගලයකු බඳවා ගැනීම සඳහා සංශෝධනය කරන ලද බඳවා ගැනීම් පටිපාටිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බව ප්‍රධාන ලේකම් වෙත දන්වන ලදි.<br><br>බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත ප්‍රධාන ලේකම්ගේ අත්සනින් යුතු ලිපියක් යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 02. | රියදුරන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. | රියදුරන් සඳහා තාක්ෂණය, විනය හා වාහන නඩත්තුව සම්බන්ධව, සම්පත්දායකයන් හඳුනාගෙන පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

<u>ඉංජිනේරු අංශය</u>

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | රාජකාරි කටයුතු සඳහා අන්තර්ජාලය භාවිතයේ දී ඇති වන දෝෂ. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිලධාරීන් දැනට අන්තර්ජාලය භාවිතා කරන ලද ආකාරය පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට පහසුකම් ප්‍රමාණවත් නොමැති බැවින් ITRDI ආයතනය වෙත පැවරීමෙන් මසක් ඇතුළත එම තොරතුරු ලබාගත හැකි බව ප්‍රධාන ලේකම් වෙත ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02. | බත්තරමුල්ල නව ගොඩනැගිල්ල තුල ප්‍රධාන ලේකම් කාර්යාලය ක්‍රියාත්මක මට්ටමින් ස්ථාපනය කිරීම. | සියලුම අංශ ප්‍රධානීන් හට තම අංශ වල නිලධාරීන් අධීක්ෂණය හා ප්‍රධාන ලේකම් හට සියලු මාණ්ඩලික නිලධාරීන් අධීක්ෂණය කිරීම සඳහා CCTV කැමරා පද්ධති සවි කිරීම වෙනුවෙන් අවධානය යොමු කිරීම.<br><br>නව පරිශ්‍රය වෙත යාමේ දී ඉවත් කළ යුතු, නව මිල දී ගත යුතු භාණ්ඩ පිළිබඳ ලේඛනයක් සකසා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු සහ අංශ ප්‍රධානීන්. |
| 03. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ කළුතර කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | නව කාර්යාලය ඉදි කිරීම වෙනුවෙන් මිලියන 10ක් පරිපූරක ඇස්තමේන්තුවට ඇතුළත් කිරීම.<br><br>එම කාර්යාලයේ බිම් සැලැස්ම අනුමත කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවීමට අවශ්‍ය රු.25000/-ක මුදල "පූර්ව ඉංජිනේරු කාර්යයන්" සඳහා ලබා දී ඇති අරමුදලින් පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රතිපාදන ලබා දීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 04. | එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් උත්සවය වෙනුවෙන් ශ්‍රාවස්ති පරිශ්‍රය සැරසීම. | රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් උත්සවය වෙනුවෙන් ශ්‍රාවස්ති පරිශ්‍රය පහත පරිදි සැරසීම කෙරෙහි අවධානය යොමු විය.<br><br>➢ LED Outdoor Digital තිරයක් කුලී පදනම මත ලබා ගැනීම සහ ප්‍රදර්ශනය කිරීම.<br>➢ බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ ලිපියට අනුව, එහි දක්වා ඇති සුබ පැතුම් බැනරය භාෂාවෙන් සකස් කර එල්ලීම.<br>➢ උද්‍යානය පුරා අටපට්ටම් හා නෙළුම් මල් වෙසක් කූඩු වියනක් ආකාරයට එල්ලීම.<br>➢ බෞද්ධ කොඩි හා පාලම් කොඩි භාවිතයෙන් සැරසීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ප්‍රධාන ලේකම් කාර්යාලීය බෞද්ධ සංගමය. |

## <u>ආදායම් දෙපාර්තමේන්තුව</u>

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 02. | බස්නාහිර පළාත් සභාව සඳහා සංවර්ධන ලොතරැයියක් හඳුන්වා දීම. | පළාත් සභාව සඳහා හඳුන්වාදෙන ඉලෙක්ට්‍රොනික සංවර්ධන ලොතරැයිපත සඳහා ප්‍රඥප්තිය සකසා අවසන් බවත්, මේ සම්බන්ධව 2017.05.16 වන දින රැස්වීමක් කැඳවා ඇති බවත් ආදායම් කොමසාරිස් විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලද අතර, එය ප්‍රඥප්ති කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කිරීම. | ආදායම් කොමසාරිස්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |